# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

## තනතුරු පුරප්පාඩු සඳහා දැන්වීමයි

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත තනතුරක් වන අතර ජාතික ඖෂධ නියාමන අධිකාරිය කොළඹ පමණක් පිහිටා ඇති අතර වෙනත් ශාඛා කාර්යාල නොමැති බැවින් ස්ථාන මාරු වීම් රහිත වේ.

**01.** රියදුරු

**බාහිර අයදුම්කරුවන් :-**

**අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.

**ප්‍රවීණතා**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

සහ

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

තනතුරට අදාළ වැටුප් පියවර : කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 පරිදි PL 3-2025 රු.(43,280 -10x490 -10x540 -10x590 -12x630 – 67,040) වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට නියමිත ආරම්භක වැටුප් පියවර වන රු.40,834/- හා අනුමත දීමනා

වයස : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවා ගැනීමේ ක්‍රමය : පත්කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙන් පසු III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ආකාරය :

| | | |
|---|---|---|
| අදාළ අතිරේක අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් | -ලකුණු | 20 |
| අදාළ පළපුරුද්ද | -ලකුණු | 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන ලද කාර්යය සාධනය | -ලකුණු | 60 |
| | | ---- |
| මුළු ලකුණු ගණන | - | 100 |

**02.** **විදුලි කාර්මික (පුරප්පාඩු ගණන 01 යි)**

**03.** **ජලනල කාර්මික (පුරප්පාඩු ගණන 01 යි)**

**04.** **නඩත්තු සහායක: (පුරප්පාඩු ගණන 01 යි)**

**බාහිර අයදුම්කරුවන්:-**

1. තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :- (පහත 1 හෝ 2)**

1. අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන, වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින් වීම

2. තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

තනතුරට අදාළ වැටුප් පියවර : කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 පරිදි PL 2-2025 රු.(42,300 -10x490 -10x540 -10x590 -12x630 – 66,060) වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට නියමිත ආරම්භක වැටුප් පියවර වන රු.40,008/- හා අනුමත දීමනා

වයස : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවා ගැනීමේ ක්‍රමය : පත්කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙන් පසු III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ආකාරය :

| | | | |
|---|---|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු | 20 |
| අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම්/ කාර්මික කුසලතා | - | ලකුණු | 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන ලද කාර්යය සාධනය | - | ලකුණු | 60 |
| | | | ---- |
| මුළු ලකුණු ගණන | - | | 100 |

**05. කාර්යාල කාර්ය සහයක (පුරප්පාඩු ගණන 10 යි)**

**බාහිර අයදුම්කරුවන් :-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම.

තනතුරට අදාළ වැටුප් පියවර : කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 පරිදි PL 1-2025 රු.(40,500 -10x450 -10x490 -7x540 -15x590 – 62,530) වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට නියමිත ආරම්භක වැටුප් පියවර වන රු.38,488/- හා අනුමත දීමනා

වයස : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය : පත්කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනීමෙන් පසු III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ආකාරය :

| | | | |
|---|---|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු | 20 |
| අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | - | ලකුණු | 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන ලද කාර්යය සාධනය | - | ලකුණු | 60 |
| | | | ---- |
| මුළු ලකුණු ගණන | - | | 100 |

වෙනත් කරුණු :-

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් යොමු කල යුතුය.

මේ සමඟ අමුණා ඇති ආකෘතියට අනුව ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත් 2026.01.22 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ප්‍රධාන විධායක නිළධාරි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථා ගොඩනැගිල්ල, 02 වන මහල, අංක 130, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කල යුතුය.

සභාපති,
ජාතික ඖෂධ නියාමන අධිකාරිය.

---